සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## ඉතිහාසය - I

නම / විභාග අංකය : ................................................ කාලය පැය 01 යි.

- සැලකිය යුතුයි

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (×) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ දී ඇති අනෙක් උපදෙස් ද කියවා පිළිපදින්න.

---

(1) ඉතිහාසය අතීත සිදුවීම් රාශියක එකතුවකි. මේ හෙයින් "වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් අතීතය තේරුම් ගත යුතුයි." මෙසේ ප්‍රකාශ කළේ

(1) රෝම ජාතික ප්ලිනිය (2) ජී. එම්. ට්‍රෙවිලියන් ය
(3) හෙරඩෝටස්ය (4) ඊ. එච්. කාර්ය

(2) ඉතිහාසය විෂයෙහි තොරතුරු තහවුරු කිරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලට ප්‍රමුඛස්ථානයක් හිමිවෙයි. එසේ හිමිවන පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

(1) කාසි, නටබුන්, නිසණ්ඩු (2) අටුවා, කැටයම්, මූර්ති
(3) සෙල්ලිපි, කාසි, නටබුන් (4) අටුවා, සෙල්ලිපි, නටබුන්

(3) පහත දක්වා ඇති "අ" හා "ආ" තීරු දෙක ගලපා නිවැරදි පිළිතුරු අංකය තෝරන්න

| "අ" | | "ආ" |
|---|---|---|
| 1. කිතුල්ගල | A | අත්තනගොඩ පිහිටි අළුලෙන |
| 2. බුලත්සිංහල | B | බටදොඹලෙන |
| 3. කෑගල්ල ආසනයේ | C | පාහියංගල ලෙන |
| 4. කුරුවිට ආසනයේ | D | බෙලිලෙන |
| | E | බෙලිගල් ගේ |

(1) E, C, A, D (2) D, B, A, C (3) C, B, A, D (4) D, C, A, B

(4) පඬුවස්දෙව් රජුගේ අග මෙහෙසිය බවට පත් වූ භද්දකච්චායනා කුමරිය ඇතුළු පිරිස ලංකාවට ගොඩබැස්සේ

(1) නැගෙනහිර වෙරළේ පිහිටි ගෝකණ්ණ වරායෙනි
(2) උතුරු වෙරළේ පිහිටි ජම්බුකෝල පට්ටන වරායෙනි
(3) වයඹ පිහිටි මහාතිත්ථ වරායෙනි
(4) දකුණු වෙරළේ පිහිටි ගොඩවාය වරායෙනි

(5) වළගම්බා රාජ්‍ය සමයේ ලංකාවට පැමිණි දේශාටන වාර්තාකරුවෙකුට අසන්නට හෝ කියන්නට නොලැබෙන සිදුවීම තෝරන්න.

(1) ක්ෂත්‍රීය අභිෂේක උත්සව ක්‍රමයක ආරම්භය දේවානම්පියතිස්ස රජුගේ පාලන සමයේ දී සිදුවිය.
(2) වසභ රජතුමාගෙන් ඇරඹි ලම්භකර්ණ රාජවංශය අවුරුදු 370කටත් අධික කාලයක් ලංකාවේ පැවතුණි.
(3) එළාර රජු අවු. 44ක් රාජ්‍ය පාලනය කළ බවත් ඊට හේතුවූයේ ඔහු සාධාරණ යුක්තිගරුක පාලකයෙක් ලෙස ක්‍රියාකළ නිසයි.
(4) සද්ධාතිස්ස කුමරු දිගාමඩුල්ල ප්‍රදේශයට ගොස් කෘෂිකාර්මික කටයුතු කර රට සහලින් ස්වයංපෝෂිත කළේ ය.

(6) සොළීන්ගෙන් පොළොන්නරුව බේරාගැනීමට උපායශීලීව ක්‍රියාකළ, පළවෙනි විජයබාහු රජු මහානාගහුල සිට මාර්ග 3කින් යුධ සේනාංක ගමන් කරවිය. ඊට අයත් නොවන මාර්ගය කුමක් ද?

(1) මහානාගහුල සිට බටහිර වෙරළ ඔස්සේ යුද හමුදාව මෙහෙයවීම

(2) මහානාගහුල සිට මහියංගනය හරහා මහවැලි ගඟ ඔස්සේ යුද හමුදාව මෙහෙය වීම

(3) මහානාගහුල සිට නැගෙනහිර වෙරළ ඔස්සේ යුද සේනාව මෙහෙයවීම

(4) මහානාගහුල සිට දකුණු වෙරළ ඔස්සේ යුද සේනාව මෙහෙයවීම

(7) "අ" තීරුවෙන් දැක්වෙන කාර්යයන්ට අදාළ වාරි නිර්මාණ අංගය "ආ" තීරුවෙන් ගලපා නිවැරදි පිළිතුරු අංකය තෝරන්න.

| | "අ" | | "ආ" |
|---|---|---|---|
| i. | කුඹුරුවලට ජලය ගෙනයෑමට වාරිමාර්ග ඇළට ජලය ලබාදෙන මාර්ගය | A | පිටවාන |
| ii. | අතිරික්ත ජලය වැවෙන් බැහැරවීමට සකස් කරන ලද්දකි | B | බිසෝකොටුව |
| iii. | ජල පහරින් වැව් බැම්මට වන හානිය වැළැක්වීමට මෙය යොදාගනී | C | මඩ සොරොව්ව |
| iv. | ජලය සොරොව්වෙන් පිටකිරීමේ දී වැව් බැම්මට වන හානිය වලක්වයි | D | සොරොව්ව |
| | | E | රළපනාව |

(1) D, A, C, B (2) D, E B, A (3) D, A, E, B (4) C, E, B, A

(8) "කලාවැවේ සිට තිසාවැවට යෝධ ඇළ දිගේ කිලෝමීටරයට මිලිමීටර් 95ක බෑස්මකින් යුක්තව ජලය ගෙන ගියේ ය" මෙම ප්‍රකාශයෙන් හැඟෙන්නේ

(1) තිසාවැවට නිතරම ජලය කලාවැවෙන් ලබාගත් බවයි

(2) අතීතයේ ලක්දිව පැවති වාරි තාක්‍ෂණයේ දියුණුවයි

(3) යෝධ ඇළෙන් වියළි කලාපයට ජලය මුදාහැරීමයි

(4) අවුරුද්දේ වැඩි කාලයක් කලාවැව ජලයෙන් පිරී තිබුණ බවයි

(9) පහත දැක්වෙන X තීරුව Y තීරුව සමඟ ගැලපූ විට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ

| | X | | Y |
|---|---|---|---|
| i. | බෙලිගල දළදා මාළිගයක් කරවීම | A | I වන බුවනෙකබාහු රජු |
| ii. | දළදා සිරිත ලියවීම | B | II වන විජයබාහු රජු |
| iii. | සේනාලංකාධිකාර සෙනෙවිරත් අගමැති වශයෙන් පත්කිරීම | C | V වන පරාක්‍රමබාහු රජු |
| iv. | වාර්ෂික උපසම්පදා උත්සව පැවැත්වීම | D | IV වන පරාක්‍රමබාහු රජු |
| | | E | III වන විජයබාහු රජු |

(1) B, D, A, C (2) E, D, C, A (3) B, D, E, C (4) B, E, C,D

(10) සිංහල හා ද්‍රවිඩ ජනතාව අතර සාමකාමී සබඳතා පවත්වාගෙන යමින් ජනප්‍රියත්වයට පත් යාපනයේ සිටි පාලකයා

(1) කුලසේකර අරියන් (2) කණකශූරී (3) වරෝදය (4) පරරාජසේකරම්

(11) ක්‍රි. ව. 1469 දී හයවන බුවනෙකබාහු නමින් රජවන්නේ

(1) සපුමල් කුමරු (2) ධර්මපාල කුමරු

(3) අම්බුලුගල කුමරු (4) ජයබාහු කුමරු

(12) සිංහල පෙරළිය, සිංහල සංගය නමින් හැඳින්වූයේ

(1) සිංහලයන් විසින් කෝට්ටේ යුගයේ ඇතිකළ පෙරළියකි

(2) කෝට්ටේ යුගයේ දී භික්ෂූන් විසින් කරන ලද සංගායනාවයි

(3) ජයබාහු කුමරු රජකමට පත්වීම නිසා සපුමල් කුමරු විසින් කරන ලද පෙරළියකි.

(4) හයවන බුවනෙකබාහු රජුට විරුද්ධව ජන ප්‍රධානීන් ගෙනගිය සටනයි.

(13) පහත දැක්වෙන තොරතුරු අතරින් ප්‍රකාශයන් තුනක් නිවැරදිය. එක් ප්‍රකාශයක් වැරදිය. එම නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ

A මායාදුන්නේ රජුගේ මරණයෙන් පසු පළවන රාජසිංහ නමින් රජවූයේ ටිකිරි කුමරු ය.

B හත්වන බුවනෙකබාහුගෙන් පසු කෝට්ටේ රජු බවට පත්වූයේ ධර්මපාල කුමරු ය.

C ක්‍රි. ව. 1462 දී උඩරට ජෝතිය සිටාණන් ඇතිකළ කැරැල්ල මර්ධනය කළේ සපුමල් කුමරු ය.

D පෘතුගීසීන් විසින් කතෝලික ආගම ප්‍රචාරය කිරීමට විරුද්ධව ව්‍යාපාරයක් ආරම්භ කළේ වීදිය බණ්ඩාර කුමරුය.

(1) A B C (2) A C D (3) A B D (4) B C D

(14) බ්‍රිතාන්‍යයන් ත්‍රිකුණාමල වරාය අත්පත් කරගැනීමට විශේෂ උනන්දුවක් දැක්වූයේ

(1) ත්‍රිකුණාමලය අත්පත් කරගැනීමෙන් පසු උඩරට රාජ්‍යය යටත් කර ගැනීමට පහසු වීම.

(2) ත්‍රිකුණාමලයේ සිට ඉන්දියාවේ නැගෙනහිර හා බටහිර වෙරළේ නාවික බලය පාලනය කළ හැකි වීම.

(3) ත්‍රිකුණාමලයට වැටෙන මහවැලි ගඟ ඔස්සේ රට අභ්‍යන්තරයට යාත්‍රා කළහැකි වීම.

(4) ත්‍රිකුණාමලය අවට ප්‍රදේශ කුරුඳු වගාවට සුදුසු වීම.

(15) මහනුවර රාජධානිය පිළිබඳ ව පහත දැක්වෙන ප්‍රකාශ අතරින් එකක් වැරදිය. එම පිළිතුර තෝරන්න.

(1) ආර්ථික මෙන් ම සමාජ ක්‍රමය ද ක්‍රියාත්මක වූයේ කුල ක්‍රමය පදනම් කරගෙන ය.

(2) සිරිත් විරිත් හා සම්ප්‍රදායන් රටේ නීතිය ලෙස පිළිගැණුනි.

(3) ලුණු, කරවල වැනි සමහර භාණ්ඩ පිට ප්‍රදේශ වලින් ලබාගෙන ඇත.

(4) වෙළඳ කටයුතු සිදුවූයේ මුදල් පදනම් කරගෙනය.

(16) දෙවන විලියම් කුමරු එංගලන්තයේ සිට ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ඉංග්‍රීසීන්ට පවරා දෙන ලෙස ඉල්ලමින් "කිව් ලිපිය" එවන අවස්ථාවේ ලංකාවේ සිටි ලන්දේසි ආණ්ඩුකාරවරයා වූයේ

(1) විලියම් ෆේ චාල්ස් (2) චාල්ස් ෆේ කැමරන්

(3) ෆන් එංගල් බෙග් (4) ෆන් එක්

(17) ශ්‍රී ලංකා ජනරජයේ අවසාන අභියාචනාධිකරණය වන්නේ

(1) ශ්‍රේෂ්ඨාධිකරණය (2) මහාධිකරණය

(3) අභියාචනාධිකරණය (4) දිසා අධිකරණය

(18) ප්‍රථම වරට සීමිත ඡන්ද බලයෙන් නියෝජිත පිරිසක් ව්‍යවස්ථාදායක සභාවට ඇතුළත් වූයේ කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් ද?

(1) ක්‍රි. ව. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය (2) ක්‍රි. ව. 1921 මැනිං ප්‍රතිසංස්කරණය

(3) ක්‍රි. ව. 1910 මැකලම් ප්‍රතිසංස්කරණය (4) ක්‍රි. ව. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

(19) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වලින් ඇතිකරන ලද වෙනස්කම මින් කුමක් ද?

(1) සර්වජන ඡන්ද බලය ලබාදීම (2) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හඳුන්වාදීම

(3) විධායක කාරක සභා ක්‍රමය හඳුන්වාදීම (4) පළාත් බද නියෝජනය ඇතිකිරීම

(20) ඉතිහාසය හදාරන සිසුවෙකු ලෙස ඔබ පහත සඳහන් සිදුවීම් කාලය අනුව පෙළගැස්සූවිට ලැබෙන පිළිතුර වන්නේ

A මුඩුබිම් පනත පනවා උඩරට දේශීය ජනතාවට උරුමවීමට තිබූ ඉඩම් ඉතා අඩු මිලකට යුරෝපීයන්ට විකිණීම

B ජෝර්ජ් බර්ඩ් නැමැත්තා ගම්පොළ සිංහපිටිය ප්‍රදේශයේ කෝපි වත්තක් ඇරඹීම.

C වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා වාරි කර්මාන්ත නගා සිටුවීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම.

D අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම.

(1) D C B A (2) B A C D (3) A B C D (4) D A C B

(21) යෝධ ඇළ හා කන්තලේ වැව, ප්‍රතිසංස්කරණය කරන ලද ආණ්ඩුකාරවරයා වන්නේ

(1) විලියම් ග්‍රෙගරි (2) හෙන්රි වෝඩ් (3) රොබට් බ්‍රවුන්රිග් (4) එඩ්වඩ් බාන්ස්

(22) ශ්‍රී ලංකාවේ තේ වගාව සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය වන්නේ

(1) ක්‍රි. ව. 1873 දී සුළු වශයෙන් තේ වගාව ඇරඹිණි

(2) ක්‍රි. ව. 1890 වන විට ශ්‍රී ලංකාවට වැඩිම ආදායමක් ගෙනත් දීමට සමත් වූ වගාව වීමය

(3) උඩරට ප්‍රදේශවල ව්‍යාප්ත වූ හැම්ලියා වැස්ට්‍රා ට්‍රික්ස් දිලීර රෝගයෙන් තේ වගාව 1868 දී විනාශ විය.

(4) තේ වගාව සඳහා ස්ථිර පදිංචිකරුවන් ලෙස දකුණු ඉන්දියානු කුලීකරුවන් තේ වතුවල පදිංචි කිරීම.

(23) i. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ අනුගාමිකයෙක් විය.

ii. ලක්දිව ජාතිකාභිමානය නැවත ඇතිකිරීමට මහත් පරිශ්‍රමයක් මෙතුමා දැරිය.

iii. මහාබෝධි සමාගම මෙතුමාගේ උත්සාහයේ ප්‍රතිඵලයකි.

iv. ජීවිතයේ අවසාන කාලය ගතවූයේ පැවිදිවීමෙනි.

මෙම සිදුවීම්වලට වඩාත් යෝග්‍ය පුද්ගලයා වන්නේ

(1) ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මහතා ය. (2) අනගාරික ධර්මපාලතුමාය

(3) වලිසිංහ හරිස්චන්ද්‍රතුමාය (4) පියදාස සිරිසේන මහතා ය.

(24) මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම පරිපාලක අසාධාරණකම් හා අයථා පාලකයන් නිසා ජනතාවට මුහුණදීමට සිදුවන හානිවලට සහන ලබාදීමේ අරමුණින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ස්ථාපිත කර ඇති තනතුර වනුයේ

(1) ඔඩිටර් ජනරාල් (2) මැතිවරණ කොමසාරිස්

(3) ඔම්බුඩ්ස්මන් (4) සොලිස්ටර් ජනරාල්

(25) මධ්‍යම ආසියාවේ ස්ටෙප්ස් තණබිම්වල ජීවත් වූ ආර්යයන් සංක්‍රමණය වූ ප්‍රදේශ නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ

(1) යුරෝපය, ඉන්දියාව, ඉරානය (2) යුරෝපය, ඉන්දියාව, අප්‍රිකාව

(3) යුරෝපය, ඉන්දියාව, ඉරාකය (4) ඉන්දියාව, අප්‍රිකාව, යුරෝපය

(26) සොළොස් මහා ජනපද අතරින් සංඝ රාජ්‍යයන් පමණක් දක්වෙන පිළිතුර වන්නේ

(1) කෝසල, මගධ (2) වජ්ජි, මල්ල (3) කුරු, පංචාල (4) වත්ස්‍ය, අවන්ති

(27) චන්ද්‍රගුප්ත මෞර්ය රජතුමා වයඹ දිග ඉන්දියාව විදේශ ආධිපත්‍යයෙන් මුදවාගැනීමට සටන් කළේ

(1) මහා ඇලෙක්සැන්ඩර් සමඟ ය. (2) යසෝධර්මන් සමඟ ය.

(3) වෙන්ගියේ වර්මන් සමඟ ය. (4) සෙලියුකස් නිකේටර් සමඟ ය.

(28) තමා ග්‍රීක ජාතික මහා ඇලෙක්සැන්ඩර් රජුගේ ප්‍රතිමූර්තියක් ලෙස හඳුන්වා දුන් පාලකයා වූයේ

(1) බක්තියාර් ඛල්ජි (2) මලික් කපූර් (3) අලා-උද්-දීන්-ඛල්ජි (4) අලාම් ලෝදි

(29) ගල් රථ දේවාලය හා වරදරාජ දේවාලය පිහිටි රාජ්‍යය වූයේ

(1) වරංගල් රාජ්‍යය යි. (2) මහමතී රාජ්‍යය යි.

(3) විජය නගර රාජ්‍යය යි (4) කාෂ්මීර රාජ්‍යය යි.

(30) "අ" තීරුව හා "ආ" තීරුව නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ

| "අ" | "ආ" |
|---|---|
| i. විලියම් හාවේ | A දේශගවේෂණය |
| ii. නිකලස් කොපර්නිකස් | B මුද්‍රණ ශිල්පය |
| iii. වස්කෝ ද ගාමා | C චිත්‍ර ශිල්පය |
| iv. ලියනාඩෝ ඩාවින්චි | D වෛද්‍ය විද්‍යාව |
| | E පෘථිවිය ගෝලාකාර බව |

(1) D, E, A, C (2) D, C B, E (3) B, D, E, A 4) D, C, A, B

(31) කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන් අතට පත්වීමෙන් පසු පෙරදිගට ඒමට නාවික මාර්ගයක් සෙවීමට යුරෝපීයයන් උනන්දු වූ ප්‍රබලම සාධකය වූයේ

(1) යටත් විජිත හිමිකරගැනීමේ පරාමර්ථය තුළින් යුරෝපීය රාජ්‍ය ධනවත් වීම.

(2) දියවැල් ආධාරයෙන් රුවල් මගින් සාගරතරණය කිරීම.

(3) මුහුදු මාර්ගය සෙවීමට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.

(4) පෙරදිගින් ලබාගත් වෙළඳ ද්‍රව්‍ය අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බවට පත්වීම.

(32) මධ්‍යතන යුගයේ පැවති වැඩවසම් ක්‍රමයේ ලක්ෂණයක් නොවන්නේ

(1) කෘෂි ආර්ථිකය පදනම් කරගෙන සමාජය සංවිධානය වීම.

(2) ප්‍රවේණියේ තිබූ වෙළඳාම දියුණුවීම නිසා මුදල් භාවිතය බහුල වීම.

(3) ප්‍රවේණිය තුළ පහළම ස්තරය ප්‍රවේණි දාසයන් වීම.

(4) ප්‍රවේණිභාර වංශාධිපතිවරුන් මධ්‍යම ආණ්ඩුවෙන් නිදහස් වූ ප්‍රාදේශීය පාලකයන් ලෙස කටයුතු කිරීම.

(33) • සංස්කෘතික විප්ලවය ආරම්භ වීමත් සමග විවිධ චෝදනා යටතේ රාජ්‍ය නිලධාරීන් අත් අඩංගුවට ගැණිනි.

• විප්ලවය කිරීමෙන් විප්ලවය ඉගෙනගන්නයැයි මොහු ප්‍රකාශ කළේ ය.

• රටේ පාසල් වසා දමා පාසල් සිසුන් යොදවා "රතුපාට ආරක්ෂක හමුදාව" පිහිටුවිය.

• තම ශක්තිය හා ධෛර්ය උපරිම වශයෙන් යොදවා විප්ලවයෙන් සතුරන් මර්දනයට මග පෙන්විය.

ඉහත සිදුවීම් එකතු කර ඔබ චරිත කථාවක් ලියන්නේ නම් එය නම් කරන්නේ පහත සඳහන් කුමන නමකින් ද?

(1) ජර්මනියේ හිට්ලර්ගේ චරිත කතාව

(2) ඉන්දියාවේ මහත්මා ගාන්ධිතුමාගේ චරිත කතාව

(3) ජපානයේ හිරෝහිතෝ අධිරාජ්‍යයාගේ චරිත කතාව

(4) චීනයේ මාඕ සේතුංගේ චරිත කතාව

(34) මුස්ලිම් ජාතිකයන්ට මොහොමඩ් අලිජින්නා සුවිශේෂ පුද්ගලයෙකු වන්නේ ඔහු

(1) මුස්ලිම්වරුන්ට වෙනම රටක් ලෙස පකිස්ථානය බිහිකර දීම නිසයි

(2) ඉරාක යුද්ධයේ දී ඇමරිකාවට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළ නිසයි.

(3) මුස්ලිම්වරුන්ට ලෝකයේ ආගමික නිදහස ලබාදීම නිසයි.

(4) මුස්ලිම් ජාතිකයන්ට බටහිරින් එල්ලවූ වෙළඳ සම්බාධක විනාශ කළ නිසයි.

(35) දී ඇති පින්තූරයෙන් දක්වෙන ගොඩනැගිල්ල හඳුන්වන්නේ කුමන නමකින් ද?

(1) ඇමරිකා එක්සත් ජනපද ජනාධිපතිතුමාගේ නිල නිවස වූ "ධවල මන්දිරය"

(2) ශ්‍රී ලංකාවේ කොළඹ නගරය පාලනය කරන නගර සභාව පිහිටි ගොඩනැගිල්ල

(3) 1947 මැක් ආතර්ගේ ව්‍යවස්ථාව අනුව පිහිට වූ ජපන් පාර්ලිමේන්තුව එනම් ඩයට් සභාවයි.

(4) චීනයේ අගමැති නිල නිවසයි



- පහත **A, B, C, D, E** හා **F** යටතේ අදහස් යුගලය බැගින් දී ඇත. ඒ එක් එක් යුගලයේ දී ඇති පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධය අධ්‍යයනය කොට අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. පළමු ලෝක සංග්‍රාමය
2. බිස්මාර්ක්ගේ ගිවිසුම් ප්‍රතිපත්තිය

B - 1. වර්සෙල්ස් ගිවිසුම
2. ඉන්දියාව

C - 1. මගේ සටන කෘතිය
2. හිට්ලර්ගේ නාසිවාදය

D - 1. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල්
2. නිත්‍ය සාමාජික රටවල්

E - 1. මාර්ෂල් සැලැස්ම
2. ඇමරිකා එක්සත් ජනපදය

F - 1. කාර්මික නගර බිහිවීම
2. ජනාකීර්ණ වීම

(36) දෙවැන්න ගැන වැඩි තොරතුරු ලොවට හෙළිවූයේ පළමුවැන්න නිසා ය.

(1) C (2) B (3) D (4) A

(37) පළමුවැන්න ඇතිවීමට දෙවැන්න ප්‍රබල හේතුවක් විය.

(1) B (2) F (3) C (4) A

(38) දෙවැන්නේ ක්‍රියාකාරිත්වයට පළමුවැන්න සම්පූර්ණයෙන්ම යටත් ය.

(1) B (2) D (3) E (4) C

(39) දෙවැන්න හා පළමුවැන්න අතර කිසිම සම්බන්ධයක් නැත.

(1) B (2) E (3) D (4) F

(40) පළමුවැන්න නිසා දෙවැන්නෙන් පෙන්වන ගැටලුව ඇතිවිය.

(1) C (2) D (3) E (4) F

ම හිමිකම් ඇවිරිණි
பதிப்புரிமையுடையது
Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## ඉතිහාසය - II

විභාග අංකය : ...................................................................................... කාලය පැය 03 යි.

I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

II කොටසින් ප්‍රශ්න තුනකට ද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.

පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

### I කොටස

(අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ලකුණු කොට නම් කරන්න.

(i) ගෝණනදී, දීඝවාපිය, මිණිපේ අමුණ, කළුතර, නල්ලූර්, පුලතිසිපුර, ඉරනමඩු වැව, මිහින්තලය, ලුණුවිල, කිතුල්ගල බෙලිලෙන (ලකුණු 10)

(ii) මධ්‍යධරණී මුහුද, බතාවියාව, ගංගා නම් ගඟ, හිරෝෂිමා, හෝමුස් සමුද්‍ර සන්ධිය, පීනීවා, ජෙරුසලම, කේරළය (ලකුණු 08)

(ආ) (i) පහත ABCD යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්ද යි අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A ලංකාව පිළිබඳ වඩාත් නිවැරදි තොරතුරු දැක්වීමට හැකිවූ විදේශිකයා ලෙස ක්‍රි. ව. දෙවන සියවසේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ සුප්‍රසිද්ධ පුද්ගලයා වූයේ


B "ක්‍රි. ව. 1165 වර්ෂයේ දී ඇති වූ නිකාය සාමාග්‍රියක් සමග සංඝ සමාජයේ විනයානුකූල පැවැත්ම සඳහා විනය නීති ඇතුළත් පොළොන්නරු කතිකාවත ගල් විහාර පර්වතයේ කොටන ලදී" මේ සඳහා පූර්ණ අනුග්‍රහය ලබාදුන් රජු නම් කරන්න.

C රාජ්‍ය බලය ලබාගැනීම සඳහා කුමන්ත්‍රණය කිරීමේ වරදට සිරභාරයට පත් වූ මොහු සිර ගෙදර දී "මගේ සටන" කෘතිය ලියා තම ජාතිය සටනට මෙහෙයවීය. ඔහු හඳුන්වන්නේ කුමන නමකින් ද?

D "චීනයෙන් බටහිරට ගෙනගිය මුද්‍රණ ශිල්පය ඇසුරින් මුද්‍රණ යන්ත්‍රය නිපදවීම ක්‍රි. ව. 1447 වර්ෂයේ දී සිදු වූ වැදගත්ම සිදුවීමයි. මේ සඳහා මුල් වූ පුද්ගලයා නම්. (ලකුණු 04)


(ii) යාබද A සහ B යටතේ දක්වා ඇති පින්තූරය අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



A 1. මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
2. මොහු ඉපදුනේ කවර රටක ද?
3. බෞද්ධයින් එකමුතු කිරීමට මෙතුමා විසින් ඇරඹූ පුවත්පත නම් කරන්න.
4. ක්‍රි. ව. 1880 දී මෙම ශ්‍රේෂ්ඨ පුද්ගලයා ලංකාවට පැමිණියේ කුමන වාදයක තොරතුරු පුවත්පත් වලින් දැකගැනීමෙන් ද?
(ලකුණු 04)

B



B 1. මෙය කුමන ආගමකට අයත් වූ ගොඩනැගිල්ලක් ද?
2. මෙය නම් කරන්නේ කෙසේ ද?
3. එය පිහිටි රට කුමක් ද?
4. එරටේ මෙවැනි ගොඩනැගිලි ඉදිවූයේ කුමන සියවසේ ද?

## II කොටස

(02) "ලක්දිව ඓතිහාසික තොරතුරු දැනගැනීමට විදේශීය සාහිත්‍යය මූලාශ්‍ර වලින් හා සෙල්ලිපි වලින් ලැබෙන්නේ විශාල පිටුවහලකි"

(i) පහත සඳහන් විදේශීය කෘති රචනා කළ කතුවරු නම් කරන්න.

- ඩිමොන්ඩො කෘතිය
- ඉන්ඩිකා කෘතිය
- නැචුරාලිස් හිස්ටෝරියා කෘතිය (ලකුණු 03)

(ii)
- ගොඩපවත වරායෙන් ලබාගත් අයබදු පිළිබඳව
- සමකාලීන වෙළඳපලක පාලනය පිළිබඳව
- ආරාම පාලනය පිළිබඳව
- අධිකරණයෙන් ලබන ආදායම විහාරයට හිමිවීම පිළිබඳව

යන ඓතිහාසික තොරතුරු ලබාගත හැකි සෙල්ලිපි පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04)

(iii) කාවන්තිස්ස රජුගේ ශ්‍රේෂ්ඨ පුත් දුටුගැමුණු රජුට ලංකා ඉතිහාසයේ වැදගත් ස්ථානයක් හිමිවෙයි. මීට බලපෑ හේතු 02ක් දක්වා ඒවා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අවුරුදු දහස් ගණනක් තරම් දීර්ඝ කාලයක් පැවති අනුරාධපුර රාජධානියේ ජීවත් වූ ජනතාවගේ ජන ජීවිතයේ කැපී පෙනුන අංග 3ක් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) "ඓතිහාසික ලංකාවේ ජල තාක්‍ෂණයට පැරණි ලාංකිකයන් තුළ තිබුණේ නොමඳ කුසලතාවයකි"

(i) පහත සඳහන් ඇළ මාර්ග හා වැව් ඉදිකළ රජවරුන් නම් කරන්න.

- ඇළහැර ඇළ
- මින්නේරිය වැව
- පදවිය වැව

(ලකුණු 03)

(ii) "ආර්ය ජනාවාස ව්‍යාප්තියේ ප්‍රතිඵලයක් ලෙස ගොවිතැන් කටයුතු සඳහා ජලය එක්රැස් කර තබාගැනීම අවශ්‍ය විය" මීට බලපෑ හේතු 4ක් ලියන්න. (ලකුණු 04)

(iii) ලක්දිව දියුණු වාරි තාක්‍ෂණයක් පැවති බවට උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කෘෂිකාර්මික හා ආගමික අංශයෙන් ඉතා දියුණු මට්ටමක පැවති පොළොන්නරු රාජධානිය පිරිහීමට බලපෑ සාධක 3ක් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට ලංකාවේ පැවති පහත සඳහන් ප්‍රාදේශීය රාජ්‍යයන් හි පාලකයන් a, b, c අනුපිළිවෙලින් නම් කරන්න.

(a) කෝට්ටේ (b) කන්ද උඩරට (c) යාපනය (ලකුණු 03)

(ii) පහත සඳහන් ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

(a) ක්‍රි. ව. 1505 දී ලංකාවට පැමිණි පෘතුගීසි නාවිකයා
(b) ක්‍රි. ව. 1602 දී ලංකාවට පැමිණි ලන්දේසි ජාතිකයා
(c) ක්‍රි. ව. 1762 දී කන්ද උඩරට රජු හමුවීමට දූත මෙහෙවරක් සඳහා පැමිණි ඉංග්‍රීසි ජාතිකයා
(d) ක්‍රි. ව. 1602 දී බලන සටන මෙහෙය වූ පෘතුගීසි සෙනෙවියා

(ප්‍රැන්සිස්කෝ ද අල්මේදා, ජෝන් ෆයිබස්, කොන්ස්තන්තිනු ද සා, ලොරෙන්සෝ ද අල්මේදා, දොන් ජෙරනිමෝ ද අසවේදු, අපොන්සු පෙරෙයිරා ද ලසර්දා, ජොරිස් ෆන් ස්පිල්බර්ජන්)

(ලකුණු 04)

(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමාගෙන් රටට සිදු වූ සේවය පහත දක්වෙන ක්ෂේත්‍රයන් යටතේ නිදසුන් දක්වමින් විස්තර කරන්න.

(a) ආගමික සේවාව (b) දේශපාලන සේවාව (ලකුණු 05)

(iv) කීර්ති ශ්‍රී රාජසිංහ රජු විලෙම් ෆැල්ක් ආණ්ඩුකාරවරයා සමඟ ඇතිකරගත් ක්‍රි. ව. 1766 ගිවිසුම ලන්දේසීන්ට වාසි සහගත ආකාරයට සිදුවූවකි. මේ බව කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින්ගේ නම් a, b, c ලෙස අනුපිළිවෙළින් දක්වන්න.

(a) බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ පාලනය සඳහා පත්කළ පළමුවන ආණ්ඩුකාරවරයා

(b) ක්‍රි. ව. 1815 න් පසු උඩරට ප්‍රදේශ පාලනය සඳහා පත්කළ බ්‍රිතාන්‍ය නිත්‍ය නේවාසික නිලධාරියා

(c) ක්‍රි. ව. 1848 පැනනැඟුණ බ්‍රිතාන්‍ය විරෝධී අරගල සමයේ මෙරට සිටි ආණ්ඩුකාරවරයා

(ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍යයන් ලංකාව යටත් කරගැනීමට බලපෑ හේතු 4ක් ලියන්න. (ලකුණු 04)

(iii) බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව උඩරටියන් ගෙනගිය පළමු නිදහස් සටන බ්‍රිතාන්‍යයන් විසින් මර්දනය කළ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) "ක්‍රි. ව. 1848 විමුක්ති අරගලයට ප්‍රබල ලෙස බලපෑවේ ක්‍රි. ව. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණයයි" කරුණු තුනක් ඇසුරෙන් මෙම තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) පක්ෂ දේශපාලන ක්‍රමය රටක ප්‍රගතිය හෝ පරිහානිය කෙරේ ප්‍රබල බලපෑම් ඇතිකරයි"

(i) කිසියම් රටක ද්වි පක්ෂ ක්‍රමයක් තිබීමේ වාසි තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලාංකික පුරවැසියෙකුට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන අවස්ථා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)


(iii) ප්‍රජාතන්ත්‍රවාදී රටක පුද්ගලයෙකු තම ඡන්ද බලය පාවිච්චි කළ යුත්තේ කෙසේ දැ යි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මහජන මතය ගොඩනැංවීමේ දී ජන සන්නිවේදන මාධ්‍ය වලින් ඉටුකළ හැකි කාර්ය භාරය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න.

## III කොටස

(07) (i) යාබද සිතියමෙහි දක්වා ඇති ඉන්දියාවේ පැවති සොළොස් මහා ජනපද අතරින් ප්‍රබල රාජ්‍යයන්ව පැවති A, B, C අක්ෂරවලින් දක්වා ඇති රාජාණ්ඩු තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන්දියාවේ ආර්ය ජනාවාස පිහිටුවීමේ දී වැදගත් වන පහත සඳහන් ස්ථාන අනුපිළිවෙළින් නම් කරන්න.




1. ඉන්දියාවට පැමිණි ආර්යයන්ගේ මුල්බිම වශයෙන් සැලකෙන ප්‍රදේශය
2. ඉන්දියාවට පැමිණි ආර්යයන් සංක්‍රමණය සඳහා බහුල වශයෙන් යොදාගත් දුර්ග මාර්ගය
3. ආර්යයන් ඉන්දියාවේ මුලින් ම පදිංචි වූ ගංගා නිම්නය
4. ආර්ය ජනාවාස දකුණු ඉන්දියාව කරා ව්‍යාප්ත වීමේ දී බාධාවක්ව පැවති කඳුවැටිය

(iii) මෞර්ය අධිරාජ්‍යයේ වැදගත් පාලකයෙකු වූ අශෝක රජතුමාගෙන් සිදු වූ ශාසනික සේවාව කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(iv) ගුප්ත යුගය ඉන්දියාවේ ඉතාමත් දියුණු සංස්කෘතියක් පැවති යුගයකි. පහත සඳහන් කරුණු ඇසුරෙන් විස්තර කරන්න.

(a) අධ්‍යාපනික තත්ත්වය (b) සාහිත්‍යය (c) ගෘහ නිර්මාණ ශිල්පය

(08) (i) පහත A B C රූපවලින් දක්වෙන්නේ දේශගවේෂණයේ යෙදුන තිදෙනෙකි. ඔවුන් අනුපිළිවෙ
නම් කරන්න. (ලකුණු



A



B



C

(ii) වැඩවසම් ක්‍රමය තුළ දක්නට ලැබුණු පොදු ලක්ෂණ 4ක් ලියන්න. (ලකුණු

(iii) මධ්‍යකාලීන යුරෝපයේ පැවති වැඩවසම් ක්‍රමය තුළ ස්වයංපෝෂිත ආර්ථික රටාවක් පැවති බ
කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු

(iv) පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපයේ ජාතික රාජ්‍ය සංකල්පය බිහිවිය. එසේ බිහි වූ ජා
රාජ්‍යයන්හි ලක්ෂණ තුනක් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු

(09) (i) පෘතුගාලයේ හෙන්රි රජතුමා නාවික ගමනාගමන කටයුතුවල යෙදෙන්නන්ට ඉටුකළ මෙ
නිසාම නාවික හෙන්රි ලෙස විරුදාවලියට ලක්විය. ඔහුගෙන් ඉටු වූ සේවාවන් තුනක් නම් කර
(ලකුණු

(ii) කාර්මික විප්ලවය නිසා දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දෙකක් දක්වන්න.
(ලකුණු

(iii) කාර්මික විප්ලවයෙන් සමාජයේ යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵල ද ඇතිවිය. එසේ ඇති වූ අයහ
ප්‍රතිඵල දෙකක් දක්වා ඒ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු

(iv) ප්‍රංශ විප්ලවයෙන් ලෝකයේ මානව අයිතිවාසිකම් බිහිවීමට විශාල පිටුවහලක් විය. මෙම ප්‍රක
සනාථ කිරීම සඳහා කරුණු 3ක් ඔස්සේ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු

(10) "පළමු හා දෙවන ලෝක යුද්ධවලින් විපතට පත් වූ ජනයා තවමත් ලෝකයේ සිටිති. එවැනි තත්ත්ව
නැවත ඇතිවීමට ඉඩනොදීම වත්මන් ලෝක නායකයින්ගේ යුතුකමකි"


(i) පළමු ලෝක සංග්‍රාමයෙන් පසු බිහි වූ ජාතීන්ගේ සංගමයේ අරමුණු 3ක් ලියන්න. (ලකුණු

(ii) ඇඩොල්ෆ් හිට්ලර් විසින් තම බලය තර කරගැනීමට යොදාගත් නාසි වාදයේ ප්‍රධාන ලක්ෂණ
ලියන්න. (ලකුණු

(iii) දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලෝකයට ලැබුණු යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵල ද ඇත. එ
උදා වූ යහපත් ප්‍රතිඵල 2ක් විස්තර කරන්න. (ලකුණු

(iv) එක්සත් ජාතීන්ගේ සංගමය ලෝක සාමය ඇතිකිරීම වෙනුවෙන් ගත් ප්‍රයත්න 3ක් උදාහරණ සපය
පැහැදිලි කරන්න. (ලකුණු

නම / විභාග අංකය : ...........................................................................................



2012 අවසාන වාර විභාගය - ඉතිහාසය 11 (ii) පත්‍රය සඳහා

2012 අවසාන වාර විභාගය - ඉතිහාසය 11 (ii) පත්‍රය සඳහා

